**ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය**

**විෂය:- මව්බස**

**කාර්ය පත්‍රිකාව :- කාර්යය පත්‍රිකා 5**

**ශ්‍රේණිය:- 4 ශ්‍රේණිය**

01)

වෙරළ වටා මුතුපර වැටියයයි
ඉන්දියන් සයුරේ මුතු ඇටයයි
පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළව තුළින්
ධන නිධාන මතු වේ
මහවැලි නිල්වලා ගඟයි
කළු වලවේ කැළණි ගඟයි
ගමින් ගමට
ගලා ගොසින්
ගොඩයි මඩයි පොහොර කරයි
පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉහත දමන දඬුව වුව ද
දලු ලා යයි පැළ වේ
සීගිරියේ ලෙන් දොරකඩ
සිටින සුරංගනාවෝ
දෝත පුරා මල් අරගෙන
අපට සතුට ගෙනාවෝ

නිල් පලසක් එළුවා සේ
රුහුණු රටයි වෙල් යායයි
පිය ගැට පෙළ කැපුවා සේ
උඩරට පොඩි ලියදි පෙළයි

දුන්හිඳ දියලුම ඇලී
ගලින් ගලට හැලි හැලී
සිහින් සිනිඳු දේදුනු මැද
මුතු වැල් වරුසා වසී

ඉරු දෙව් මුහුදින් ඇදී
සමනොළ කන්දට වදී
එතකොට මුළු ලංකාව ම
දිලිහෙයි ලස්සන වෙවී

(මහගම සේකර)

(කැමැත්තෙන් හා රස විඳමින් ලියමි)

- කවි පෙළ ඇසුරෙන් අසන ප්‍රශ්න වලට පිළිතුරු වාචිකව ලබා දෙන්න

1) අපේ රට හඳුන්වන වෙනත් අන්වර්ත නාමයක් කියන්න.

2) ලංකා පොළවේ පසට යට වී ඇත්තේ මොනවාද?

3) ගීතයේ සඳහන් ගංගා මොනවාද?

4) ගංගා ගලා ගොස් සිදු කරන වැදගත් ම දෙය කුමක්ද?

5) නිතර ම පොළවේ රැඳී දිලෙන පැහැය කුමක්ද?

6)මෙහි සඳහන් ලෝක උරුමය කුමක්ද?

7) නිල් පලසක් එළුවා සේ පෙනෙන්නේ කුමක්ද?

8) දුන්හිඳ දියලුම යනු මොනවාද?

9) ගීතයේ සඳහන් පූජනීය කන්ද කුමක්ද?

10) සරු පොළවක් අපට ඇතේ ගීතය රචනා කර ඇත්තේ කවු ද?

- පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

1) වෙරළ වට ඇත්තේ කුමක්ද?

2) රත්නදීප පොළව තුළින් මතු වන්නේ කුමක්ද?

3) කවි පන්තියේ සඳහන් ගංගා නම් කරන්න

4) කවි පෙළෙහි සඳහන් දිය ඇලි මොනවාද?

5) කවි පෙළෙහි සඳහන් කඳු වැටිය කුමක්ද?

6) ලෝක උරුමයක් ලෙස හඳුන්වන මෙම කවි සඳහන් පර්වතය කුමක්ද?

7) උඩරට වෙල්යායවල් පෙනෙන්නේ කෙසේද?

8) අප රටේ පොළව සාරවත් බව කියවෙන කවි පද උපුටා ලියන්න.

9) අඩු අකුරු ලියන්න

1) මැ__ක් 4) රත්න__ප

2) නි__න 5) කැල__

3) රුහු__ 6) සිනි__

10) කවි පෙළෙන් සමාන පද සොයා ලියන්න

1) සාගරයේ-..............................

2) භූතලය -................................

3) කොළ පාට -..................................

4) දෑත- ..................................................

5) පඩිපෙළ - ........................................

පෙර වැඩ

- ❖සරු  පොළවක් අපට ඇතේ කවි පන්තිය තාලයට ගායනා කරන්න

පසු වැඩ

- ❖කවි පන්තියේ සඳහන් දේවල් ඇතුළත් කරමින් මගේ රට මැයෙන් අලංකාර චිත්‍රයක් අඳින්න.

සැකසුම:-

ඊ.ඩී.එස්.මල්කාන්ති

ර/ඇඹි/වීරබා ආදර්ශ විද්‍යාලය

4 ශ්‍රේණිය බාර ආචාර්ය